**ජගත් සිදුවීම්**

# ළමයින්ගේ සුවසෙත පතා රැස්වන ලෝක සමුළුව

**එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය පවත්වන 2001 සැප්තැම්බර් 19-20 දිනවලදී ළමයින් පිළිබඳ විශේෂ සැසිවාරයට ලෝකයේ රාජ්‍ය නායකයන්, රාජ්‍ය පාලකයන්, රාජ්‍ය නොවන සංවිධාන, ළමා අයිතීන් වෙනුවෙන් කතා කරන්නන් පමණක් නොව ළමයින් ද එක් වීමට නියමිත ය.**



එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා විසින් ගත වූ වසර 10 තුළ ළමයින් උදෙසා කළ කටයුතුවල ප්‍රගතිය දැක්වෙන වාර්තාව ඉදිරිපත් කිරීමෙන් එම සැසිය ආරම්භ වේ. විශේෂ දින තුනක කාලයක් තිස්සේ ඊට සහභාගිවත්තත් ළමයින් වෙනුවෙන් ඊළඟ දශකය තුළ ගත යුතු වැදගත් ම ක්‍රියාමාර්ග පිළිබඳ ව එකගත්වයකට පැමිණෙනු ඇත.

දශකයකට වැඩි කාලයකට පෙර ලෝක නායකයෝ ළමයින් පිළිබඳ දැවෙන ප්‍රශ්න තමන්ගේ දේශපාලන වැඩසටහන්වලටත්, මානව අයිතිවාසිකම් පිළිබඳ සිතියමටත් ඇතුළු කළහ. 1990 දී ළමයින් පිළිබඳ ව එක්සත් ජාතීන්ගේ ලෝක සමුළුවක් පැවැත්වීම ඒ අතින් සිදුවුණු ඉතාමත් වැදගත් සිදුවීම වෙයි. එම සමුළුව මගින් කාර්යසාධක සැලැස්මක් සකස් කරන ලද අතර ලෝක ළමුන්ගේ සෞඛ්‍යය හා ආරක්ෂාව තහවුරු කරනුවස් කාල වේලාවන් සහිත ඉලක්ක ද නියම කෙරිණ. ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය පිළිගැනීමට හා ක්‍රියාවට නැංවීමට අවශ්‍ය වැඩසටහනක් ද දියත් කෙරිණ. රජයන් ඒ අතින් දුන් ප්‍රතිඥා ඒ ඒ රජයන් විසින් ඒ අයුරින් ම ඉටු කළේ ද යන්න විමසා බැලීමට දැන් කාලය එළඹ ඇත.

ළමයින්ගේ හා යව්වනයන්ගේ ජීවිතවලට පූර්ණව බලපාන අයුරින් ප්‍රඥප්තිය ක්‍රියාවට නැංවීමේ ප්‍රයත්නයන් ආරම්භ වූයේ 1990 සමුළුවෙන් පසුව ය. එහිදී ළමා හා මාතෘ මරණ, වළක්වා ගත හැකි රෝග, අකුරු නොදත්කම හා මන්දපෝෂණය අඩු කිරීමට කාර්ය සාධක සැලැස්මක් සකස් කරනු ලැබී ය. එසේ ම එහි දී ළමයින්ට මූලික අධ්‍යාපනය, ආරක්ෂිත පානීය ජලය, නිරෝගී දිවියකට අත්‍යවශ්‍ය ආහාර, සනීපාරක්ෂක පහසුකම් ලබා දීමේත්, ළමයින් අපයෝජනයෙන්, ප්‍රචණ්ඩත්වයෙන් හා යුද්ධයෙන් ආරක්ෂා කර ගැනීමේත් ඇති අවශ්‍යතාව ද අවධාරණය කෙරිණ.

1990 පටන් ම මෙහි ප්‍රගතියක් දක්නට ලැබිණ. රටවල් 125 ක් ම එක් පරම්පරාවකින් සියයට 80 කට සරම්ප හා පිටගැස්ම වැනි ළමා කල බහුල රෝග සඳහා ප්‍රතිශක්තිකරණය ලබා දීමට සමත් විය. 1999 දී පමණක් ලෝකයේ අවු: 5 ට අඩු ළමුන්ගෙන් තුනෙන් දෙකකටත් වඩා, එනම් මිලියන 470 ක් සඳහා පෝලියෝ ප්‍රතිශක්තිකරණය ලබා දීමට හැකි විය. මිලියන 12 කට වැඩි ළමුන්ගේ ආහාරයට අයඩීන් එක් කිරීම නිසා නවදුරටත් මානසික ආබාධ තත්ත්වයට පත්වීමේ අවදානමක් නැත.

මිනිස් ඉතිහාසයේ වෙන කවරදකවත් නොවූ විරූ තරමින් ළමයි අද පාසල් යති. ළමයින් විසින් ඔවුන්ගේ ම පාර්ලිමේන්තු හා සාම ව්‍යාපාර අරඹා තිබේ. ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියට ඇතුළත් නීති රීති බොහෝ රටවල් විසින් තම නීති පද්ධතිවලට ඇතුළත් කර ගෙන තිබේ.

දශකය අවසානයේ දී කළ, ළමයින් පිළිබඳ ප්‍රගති වාර්තාවට අනුව තවත් කළ යුතු බොහෝ දේ ඉතිරි ව තිබේ. සිවිල් යුද්ධවල හිංසනය හා සන්නද්ධ කැරලි නිසා නොකඩවා ම ලෝකයේ ළමයි විශාල වශයෙන් විනාශයට හා මහත් ව්‍යසනයට පත් කෙරෙති. ලොව පුරා අවතැන් වන මිලියන 31 ක් වන සරණාගතයන්ගෙන් වැඩි දෙනා ළමුන් හා කාන්තාවන් ය. ඇති නැති පරතරය භයානක ලෙස වැඩි වන බැවින් එහි බලපෑම් නිසා ළමා මෙහෙකාරකම්, නීති විරෝධී කටයුතුවලට යොදා ගැනීම්, ලිංගික අපයෝජනයන් ද වර්ධනය වී තිබේ. ලෝක කම්කරු සංවිධානයට අනුව සංවර්ධනය වෙමින් පවතින රටවල අවු: 5ත් 14 ත් අතර ළමයි මිලියන 250 ක් පමණ රැකියා කරති. ඉන් අවු: 5 ත් 11 ත් අතර මිලියන 50 ත් 60 ත් අතර ගණනක් ළමයින් රැකියා කරන්නේ අන්ත දුක්ඛිත තත්ත්වයන් යටතේ ය.

ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය සම්මත කර ගැනීමෙන් පසු දශකය තුළ සන්නද්ධ අරගල නිසා ළමයි මිලියන 2කට වැඩි ප්‍රමාණයක් මරණයට පත් වූහ. මිලියන 6 ක් තුවාල ලැබූහ. ආබාධිත වූහ. බිම් බෝම්බ වලට දස දහස් ගණනින් ගොදුරුව අංග විකල බවට පත් වූහ. ඉඩම්වලට ඇති තණ්හාවත්, තෙල් මැණික් වැනි ස්වභාවික සම්පත්වලට ඇති වැඩිහිටියන්ගේ අතෘප්තකර ආශාවන් නිසා දහස් ගණන් ළමයි පීඩාවට පත් වෙති. සැහැල්ලු හා අඩු මිල අවි ආයුධ

බහුල වීම නිසා වැඩිහිටියන්ගේ යුද්ධවලට සටන් කරන්නට වඩ වඩා ළමා සොල්දදුවන් යොදා ගැනීම ද දැන් සිදු වෙයි. තවත් ගණන් පදම් නැති බොහෝ ප්‍රමාණයක් ළමා පිරිස් ලිංගික වහලුන් හා කම්කරුවන් සේ බඳවාගනු ලබති.

අවු: 15ට අඩු ළමයින් මිලියන 4.3 කටත් අධික පිරිසක් ඒඩ්ස් නිසා මේ වන විට මරණයට පත් වී තිබේ. අවු: 15ට අඩු ළමයි මිලයන 1.4 කට වැඩි පිරිසක් එච්.අයි.වී ආසාදනයට ලක් වී සිටිති. සෑම මිනිත්තුවක දී ම අවු: 15ත් 24ත් අතර ගැටවරයන් පස් දෙනෙක් එච්.අයි.වී. ආසාදනයට ගොදුරු වෙති. එය දිනපතා 7000කි. තම දෙමාපියන් ඒඩ්ස් රෝගයෙන් මියයාම නිසා මිලියන 13ක් ළමයි අනාථ වෙති. ඒ අතර ම අවු: පහට අඩු ළදරුවන් ගෙන් අඩු තරමින් සියයට තිහක්වත් දරුණු හෝ බරපතල ලෙස මන්දපෝෂණ තත්ත්වයෙන් පෙළෙති. ධනවත් රටවල පවා 10ට එකක් ළමයින් ඇතිදැඩි වන්නේ දිළිඳුබව දක්වෙන රේඛාවට පහළින් ජීවත්වන පවුල්වල ය.

ඉදිරියට තබන සෑම පියවරක දීම, ක්‍රියාත්මක නොවීම හා පොරොන්දු ඉටු නොකිරීම හේතුවෙන් ළමයින් ගේ ප්‍රගතියට බාධා පැමිණේ. 2001 වසර අප ආරම්භ කළේ ගත වූ සියවසේ අතපසු වූ කටයුතු රාශියක් හා මතු වූ නව අභියෝග රාශියක් ද සමඟ ය.

ළමයින් පිළිබඳ මේ විශේෂ සැසිවාරය, ළමයින් වෙනුවෙන් ඇරඹෙන නවයුගයක් ලෙස සැලකිය හැකි ය. එය එක් අතකින් රාජ්‍ය පාලකයන් ළමයින් වෙනුවෙන් ඔවුන් සතු වගකීම් පිළිගැනීමක් ලෙස ද, අනික් අතින් ළමයින් වෙනුවෙන් කතා කිරීම හා ක්‍රියා කිරීම සෑම පුරවැසියකු ගේ ම වගකීමක් හා සෑම පුරවැසියකුට ම භාර කටයුත්තක් හැටියට භාර ගැනීමක් ලෙස ද දැක්විය හැකි ය.

මේ සඳහා කැපවීම මානව පවුලේ සාමාජිකයන් වශයෙන් අප හැම කෙනෙකුගේ ම වගකීම හා යුතුකම වේ. ඒ සඳහා කැපවිය යුතු කරුණු දහයක් මෙසේ ගොනුකොට ඇත.

**1. කිසිම ළමයකු නොසලකා හැරිය යුතු නැත**

සෑම ගැහැනු පිරිමි ළමයකු ම



**යුද කටයුතුවලට බහුලව ළමයින් යොදා ගැනීම සිදුවේ. මේ එල්ටීටීඊ ළමා සොල්දදුවන් දෙදෙනෙක්.**

ළමයින් පිළිබඳ මේ විශේෂ සැසිවාරය, ළමයින් වෙනුවෙන් ඇරඹෙන නවයුගයක් ලෙස සැලකිය හැකි ය. එය එක් අතකින් රාජ්‍ය පාලකයන් ළමයින් වෙනුවෙන් ඔවුන් සතු වගකීම් පිළිගැනීමක් ලෙස ද, අනික් අතින් ළමයින් වෙනුවෙන් කතා කිරීම හා ක්‍රියා කිරීම සෑම පුරවැසියකු ගේ ම වගකීමක් හා සෑම පුරවැසියකුට ම භාර කටයුත්තක් හැටියට භාර ගැනීමක් ලෙස ද දැක්විය හැකි ය.

සමාන ගරුත්වයක් හා සියලු ම අයිතිවාසිකම්වලට උරුමයක් ඇති ව නිදහස් ව උපත ලබන බැවින් සියලු ආකාරයේ වෙනස්කම් කිරීම්වලට හා නොසලකා හැරීම්වලට ලක් නො විය යුතු ය.

**2. ළමයින්ට මුල්තැන දිය යුතු ය.**

රජයන් ළමුන්ට හා තරුණ ජනතාවට ඉටු කළ යුතු තම වගකීම් නොපිරිහෙළා ඉටු කළ යුතු ය. එසේ ම සෑම අයකු ම, සෑම පුද්ගලයකු ම ඇතුළුව, රාජ්‍ය නොවන සංවිධාන, ආගමික කණ්ඩායම්, පුද්ගලික අංශ මෙන් ම ළමයින් හා යොවුන් අය පමණක් නොව සෑම සියලු දෙනා ම ළමයින්ගේ අයිතිවාසිකම්වලට ගරු කොට ඒවා තහවුරු කිරීමට තමන්ට ඇති වගකීම හඳුනා ගත යුතු ය.

**3. සෑම ළමයකු ම රැක ගත යුතු ය**

සෑම ළමයකුට ම ලැබිය යුතු ඉහළ ම සෞඛ්‍ය මට්ටම, විශේෂයෙන් ම, ප්‍රතිශක්තිකරණය, නිසි පෝෂණය හා ආහාර, පිරිසිදු ජලය හා ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම්, යෝග්‍ය නිවාස හා රක්ෂිත ව වැඩෙන්නට සෞඛ්‍ය සම්පන්න පරිසරයක් ලබා දිය යුතු ය.

**4. එච්.අයි.වී / ඒඩ්ස්වලට එරෙහි ව සටන් කළ යුතු ය.**

එච්.අයි.වී /ඒඩ්ස් හේතුවෙන් ඇති වන විනාශකාරී බලපෑම් වලින් ළමයින්, යෞවනයන් හා ඔවුන්ගේ පවුල් මුදා ගත යුතු ය.

**5. ළමුනට හානි පැමිණවීම හා ළමුන් සූරාකෑමට ලක් කිරීම නවතා දැමිය යුතු ය.**

ළමයින් පීඩාවට පත් කෙරෙන ප්‍රචණ්ඩත්වය, ළමා අපයෝජනය (අනිසි දෙයට යොදා ගැනීම) හා ළමා උපයෝජනය (සූරා කෑම) වහා ම නැවැත්විය යුතු ය. ළමයින් ලිංගික ව හා ආර්ථිකව සූරාකෑම්වලට ලක් කිරීම ද මුළුමනින් ම වැළැක්විය යුතු ය.

**6. ළමයින්ට සවන් දිය යුතු ය.**

තමන්ගේ අදහස් පළ කිරීමටත්, නිරතුරුව වර්ධනය වන තම හැකියාවන් අනුව තමන්ට බලපාන කරුණු පිළිබඳව තීරණ ගැනීමේදී ඒවාට සහභාගිවීමටත්, තම මත පළ කිරීමටත්, ළමුනට හා යොවුන් අයට ඇති අයිතියට සෑම කෙනෙකු ම ගරු කළ යුතු ය.

**7. සෑම ළමයකුට ම අධ්‍යාපනය ලබා දිය යුතු ය.**

ඉතා හොඳ තත්ත්වයේ ප්‍රාථමික අධ්‍යාපනයක් නොමිලයේ ම සියලු ම ගැහැනු හා පිරිමි ළමුනට අනිවාර්යයෙන් ම ලබා දිය යුතු ය.

**8. ළමයින් යුද්ධයෙන් ආරක්ෂා කර ගත යුතු ය.**

සන්නද්ධ ගැටුම් වලින් ඇති වන බියකරු තත්ත්වයන් ගෙන් ළමුන් බේරා ගත යුතු ය.

**9. ළමුන් වෙනුවෙන් මිහිතලය (පෘථිවිය)) රැක ගත යුතු ය.**

අනාගත පරම්පරාවන්ගේ යහපැවැත්ම හා ආරක්ෂාව සහතික කරනුවස් මිහිතලයට අයත් පරිසරය, ජාතිය හා දේශීය වශයෙන් ආරක්ෂා කර දීම පිණිස, රජයන්, සිවිල් සමාජ හා පුද්ගලික අංශ ඇතුළු අප සෑම දෙනකු විසින් ම ඉතා ඉක්මනින් ගත යුතු පියවර කීපයක් ම තිබේ.

**10 ළමුන් සඳහා ආයෝජනයක් ලෙස දිළිඳුකමට එරෙහි ව සටන් කළ යුතු ය.**

ළමයින් වැඩියෙන් ම පීඩාවට පත් වන්නේ දිළිඳුකම නිසා වන බැවින් දිළිඳුකමට එරෙහි සටන ඇරඹිය යුත්තේ ඔවුන්ගෙනි. අන්ත දිළිඳු ළමුන් හා ඔවුන්ගේ පවුල්වල යහපත උදෙසා කැප වුණු මූලික සෞඛ්‍ය සත්කාරය හා ප්‍රාථමික අධ්‍යාපනය සපයන සමාජ සේවා ආයෝජනයන් ඊට ඇතුළත් වෙයි.

ඒ සමඟ ම ළමයින්ගේ යහපැවැත්ම, ණය සහන වැඩ සටහන්වල සංවර්ධන සහය සපයන වැඩසටහන්වල හා රජයේ වියදම්වල ප්‍රමුඛතම අරමුණක් විය යුතු ය. ❏

**යුනිසෙෆ් අනුග්‍රහයෙනි.**